# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2042/23 - 2017 ඔක්තෝබර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2017.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KDS/AKU/4/2/1/52.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2015/WS/111.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ. අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, දිප්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2017 අගෝස්තු මස 23 වැනි දිනැතිව මැන සකස් කරන ලද, අංක මහ 6729 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන තලහේන නැමති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0379 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. කැබලි අංක 01
ඉඩමේ නම: තලහේන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0379

*මායිම් විස්තර:*
උතුරට :ප්‍රාදේශීය සභා මාර්ගය; නැගෙනහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ ඩී. ජී. පියසේන හිමිකම් කියන තලහේන; දකුණට:ඩී. ජී. පියසේන හිමිකම් කියන තලහේන සහ ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට:ප්‍රාදේශීය සභා මාර්ගය

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන් ; ඩී. ජී. පියසේන මහතා, අංක 600, දිප්පිටිය, අලවතුගොඩ

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 දෙසැම්බර් මස 21 වැනි දින පෙ. ව. 10.00 ට අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 ජනවාරි මස 21 වැනි දිනට මත්තෙන් එම ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

මාධව වර්ණකුලසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2017 ඔක්තෝබර් මස 22 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

11-553



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DIVPANN/LND/ACDEP/1/4/9.

2007 ජූලි 09 වැනි දිනැති අංක 1505/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත සඳහන් දැන්වීමේ ඉඩමේ ප්‍රමාණය හෙක්. 0.0632 යනුවෙන් සඳහන් වී ඇතත් එය හෙක්. 0.0630 ක් වශයෙන් නිවැරදි විය යුතු බවත්,

ඉහත දැන්වීමේ විස්තරය අවසාන ගම් පිඹුර 323 දරන පිඹුරේ කැබලි අංක 51 වශයෙන් සඳහන්ව ඇතත් එය අවසාන ගම් පිඹුර 323 දරන පිඹුරේ කැබලි අංක 52 වශයෙන් නිවැරදි විය යුතු බවත්,

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2017 දෙසැම්බර් මස 13 වැනි දින පූ. භා. 10.00 ට පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තවද 2017 දෙසැම්බර් මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ආර්. එම්. එස්. වික්‍රමරත්න බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
පන්නල.

පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-554

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.